ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025-01-23

සී.එස්.ඒ. මහානාම
අංක. 52/12, එම්සී පාර,
මාතලේ.

පැමිණිලිකාර පාර්ශවය

එම්.වී.එම්.ජී.මහානාම
අංක. 52/12, එම්සී පාර,
මාතලේ.

පැමිණිලි අංකය : **HRC/KND/573/22/A**

වින්දිත පාර්ශවය

1. පො.ප.වල්පොල,
   පොලිස් ස්ථානය,මාතලේ.
2. උ.පො.ප.චමින්ද,
   පොලිස් ස්ථානය,මාතලේ.
3. පො.සැ.21636 ප්‍රියන්ත
   පොලිස් ස්ථානය,මාතලේ.
4. පො.සැ. 21423 නලින්ද
   පොලිස් ස්ථානය,මාතලේ.
5. පො.කො.73181 ලයනල්
   පොලිස් ස්ථානය,මාතලේ.
6. පො.කො.71224 බංඩාර
   පොලිස් ස්ථානය,මාතලේ.
7. පො.කො.77615 වීරරත්න
   පොලිස් ස්ථානය,මාතලේ.
8. පො.කො.83301 උදේශ්
   පොලිස් ස්ථානය,මාතලේ.
9. ප්‍ර.පො.ප. එස්.එස්. කේ. රත්නායක
   මූලස්ථාන පොලිස් පරීක්ෂක (වැ.බ.)
   පොලිස් ස්ථානය,මාතලේ.

වගඋත්තරකාර පාර්ශවය

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

## පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම

පැමිණිලිකාර පාර්ශවය වන සී.එස්.ජී. මහානාම යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2022.12.05 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය තම වැඩිමහල් පුත්‍රයා වන බවත්, 2022.11.15 වන දින මීවත්තකුඹුර පාරේ පිහිටි පුත්‍රයාගේ මිතුරෙකුගේ නිවසකදී හෙරොයින් ළඟ තබා ගැනීමේ චෝදනාව මත මාතලේ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් විසින් ඔහු අත්අඩංගුවට ගෙන ඇති බවත් ප්‍රකාශ කර ඇත. එසේම, එම නිලධාරීන් විසින් පොලිස් ස්ථානය තුළ දී වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය හට පහරදීම් සිදු කර ඇති බවත්, එම පහරදීම් හේතුවෙන් ඔහුගේ වම් අතේ සුලගිල්ල කැඩී තිබූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව මාතලේ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් විසින් අසත්‍ය කරුණු වාර්තා කරමින් ගරු අධිකරණය නොමඟ යවමින් වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය බන්ධනාගාර ගත කිරීමට කටයුතු කර ඇති බව ද පැමිණිලිකරු විසින් දක්වා ඇත.

## වින්දිත පාර්ශවයේ කරුණු දැක්වීම

වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය විසින් 2023.07.31 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් තමා 2022.11.14 වන දින සවස මීවත්තකුඹුර පාරේ සිතාර නැමති මිතුරාගේ නිවසේ පැවති උපන්දින සාදයකට සහභාගි වූ බවත්, සාදය නිමවී රෑ වූ නිසා තමා එම මිතුරාගේම නිවසේ නවාතැන් ගත් බවත් ප්‍රකාශ කර ඇත. පසුදින එනම්, 2022.11.15 වන දින පෙ.ව. 07.30 ට පමණ තමා සමඟ සිතාර නැමති මිතුරා හා තවත් මිතුරකු සිතාරගේ නිවසේ උඩු මහළේ සිටියදි සිවිල් ඇඳුමින් සැරසුණු කණ්ඩායමක් ඔවුන්ගේ පුද්ගලික රථයකින් පැමිණ තමන් ඇතුළු මිතුරන් සිටි කාමරයට ඇතුළු වී කාමරය පරික්ෂා කර තමාගේ ඇඳුම් ගලවා පරික්ෂා කළ බවත්, තමා සමඟ සිටි අනෙක් මිතුරන් දෙදෙනාද පරික්ෂා කරන ලද බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමා විසින් "ඇයි සර් මොකක්ද අපි කළ වරද" කියා ඔවුන්ගෙන් විමසූ බවත්, පසුව තමාව ප්‍රියන්ත නැමති නිලධාරියා කාමරයේ මුල්ලකට ගෙන ගොස් "දණ ගහපන්, දණ ගහපන්" කියා තමාට පරුෂ වචනයෙන් බැණ වදිමින් පහරදුන් බවත්, තමා දණගැසීම ප්‍රතික්ෂේප කළ විට තමාව බලෙන් ඇදගෙන ගොස් දණගස්සවා ප්‍රශ්න කරමින් දිගින් දිගටම පහරදුන් බවත්, එතැන සිටි තවත් නිලධාරින් දෙතුන් දෙනෙක්ම එලෙස පහරදුන් බවත් දක්වා ඇත. පසුව තමා සහ තමා සමඟ සිටි මිතුරන් දෙදෙනාත් පෙ.ව.8.30 ට පමණ එම වාහනයෙන්ම මාතලේ පරණ පොලිස් ස්ථානයට ගෙන ගිය බවත්, ඉන්පසු එකී පොලිස් ස්ථානයේ රඳවා ගනිමින් දිගින් දිගටම ප්‍රශ්න කරන ලද බවත්, පසුව ප.ව. 3.45 ට පමණ මාතලේ පොලිස් ස්ථානයට රැගෙන ගොස් භාරදුන් බවත් ප්‍රකාශ කර ඇත.

ඉන්පසුව 2022.11.16 වන දින තමා ඇතුළු අනෙක් අයව මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, ඒ වන විටත් තමාගේ වම් අතේ ඇඟිල්ලක් කැඩී තිබුණු බවත්, තමා අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී පොලිසිය විසින් තමාට පහරදුන් බව විනිසුරුතුමිය වෙත කියා සිටි බවත්,

එවිට විනිසුරුතුමිය මාතලේ මහ රෝහලට ඇතුළත් කර වාර්තාවක් ලබාදෙන ලෙස නියෝග කළ බවත් සඳහන් කර ඇත. පසුව අධිකරණ වෛද්‍යතුමිය තමා පරීක්ෂා කර බලා මාතලේ මහ රෝහලේ 19 වැනි වාට්ටුවට ඇතුලත් කර තමාගේ ඇඟිල්ල ශල්‍ය කර්මයකට භාජනය කළ බවත්, දින 04ක පමණ කාලයක් මාතලේ මහ රෝහලේ නැවතී ප්‍රතිකාර ලබාගත් බවත්, පසුව පල්ලේකැලේ රක්ෂිත බන්ධනාගාරය වෙත යොමු කළ බවත්, එහි බන්ධනාගාර රෝහලේ සති දෙකක පමණ කාලයක් ප්‍රතිකාර ලබාගත් බවත් වින්දිත පාර්ශවය විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම.</u>

පැමිණිල්ලට අදාලව 9 වන වගඋත්තරකරු විසින් අංක OW/702/2023 සහ 2023.02.16 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් දක්වා ඇත්තේ, වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය හෙරොයින් මිලිග්‍රෑම් 2740ක් තම සන්තකයේ තබාගැනිම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 1676/22 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසු 2023.02.20 දින දක්වා රක්ෂිත බන්ධානාගාර ගතකර ඇති බවයි.

2023.10.25 වන දින මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෝ ඉන්පසුව කිසිදු පොලිස් නිලධාරියෙකු විසින් ඔහු හට පහරදීමක් සිදු කර නොමැති බවයි. එසේම, අත්අඩංගුවට ගැනීමේදී වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය ප්‍රතිරෝධය පෑම හේතුවෙන් ඔහුගේ දකුණු පාදයේ දණහිස සහ උරහිස බිම වැදුණු බව ද වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

2022.11.15 වන දින පැය 07.00ට 1 වන වගඋත්තරකරු වන පො.ප.වල්පොල යන නිලධාරියා හට වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම සහ සිතාර යන දෙදෙනා නීති විරෝධී මත්ද්‍රව්‍ය අලෙවි කරන බවට පුද්ගලික තොරතුරුකරුවෙකුගෙන් ලැබුණු තොරතුරක් මත 1 සිට 8 දක්වා වන වගඋත්තරකරුවන් විසින් අදාළ වැටලීම සඳහා පිටත්ව ගොස් ඇති බවත්, 2022.11.15 වන දින පැය 11.00ට ඩයිඇසටයිල් මෝෆින් හෙවත් හෙරොයින් මිලිග්‍රෑම් 2740ක් තම සන්තකයේ තබා ගැනීමේ චෝදනාව කියා දී වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය අත්අඩංගුවට ගෙන ඇති බවත් මාතලේ පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 223 සහ ඡේදය 233 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

එසේම, අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2022.11.16 වන දින වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය අංක බී 1676/2022 යටතේ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එහිදී පොලිස් නිලධාරීන් විසින් තමන්ට පහරදුන් බවට වින්දිත පාර්ශවය විසින් අධිකරණයට දැනුම් දී ඇති බවත්, එහිදී මහේස්ත්‍රාත්වරයා විසින් වින්දිත පාර්ශවය එදිනම

මාතලේ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත බන්ධනාගාරය මගින් ඉදිරිපත් කළ යුතු බවටත් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු බවටත් නියෝග කර ඇති බවටත් අංක බී 1676/2022 දරණ නඩුවේ 2022.11.16 දිනැති ජර්නල් සටහන අනුව නිරීක්ෂණය වේ.

මාතලේ මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි එම්.ආර්. නිස්රීන් විසින් ඉදිරිපත් කර ඇති වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ඔහුගේ වම් සුලැගිල්ලේ අස්ථි බිඳීමක් සිදුවී ඇති බවත්, එය බරපතළ තුවාලයක් වන බවත්, වම් පාදයේ පහළ කොටසේ සෙ.මී.2 x 0.5 ප්‍රමාණයේ සීරීමක් ඇති බවත්, එය වම් විලුඹ ප්‍රදේශයේ සිට සෙ.මී.10ක් ඉහළින් පවතින බවත්, එය බරපතළ නොවන තුවාලයක් වන බවත් සඳහන් කර ඇත. තවද, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ 'රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය' යන්න තුළ තමා හට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බව වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කළ බව සඳහන් වන අතර, ඉහත කී තුවාල වින්දිත පාර්ශවය විසින් ලබාදී ඇති රෝග ඉතිහාසය සමඟ සැසඳෙන බව ද අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් එම වාර්තාව තුළ දක්වා ඇත. එසේහෙයින් වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය හට පොලිස් නිලධාරීන් විසින් පහර දී ඇති බවත්, එම පහරදීම් හේතුවෙන් ඔහු හට තුවාල සිදු වී ඇති බවත් තහවුරු වේ.

2023.10.25 වන දින මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වින්දිත පාර්ශවය විසින් ඔහු හට පහරදුන් නිලධාරීන් අතරින් 3 වන වගඋත්තරකරු වන පො.සැ.21636 ප්‍රියන්ත යන නිලධාරියා පමණක් හඳුනාගන්නා ලද අතර සෙසු අයවලුන් හඳුනාගැනිමට අපොහොසත් වී ඇත. තවද, එකී පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනිමේදී ඔහුගේ දකුණු පාදයේ දණහිස හා උරහිස බිම වැදුණු බවට ප්‍රකාශ කර ඇති නමුත්, වින්දිත පාර්ශවයට අදාලව ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ එකී ස්ථානයන්හි තුවාල පිහිටා ඇති බවට සඳහන් නොවන බව ද නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු වන පො.ප. වල්පොල නම් නිලධාරියා විසින් මාතලේ පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතේ 2022.11.19 වන දින පිටුව 297 සහ ඡේදය 275හි පැය 00.20ට යොදා ඇති විභාග සටහනෙහි සඳහන් කර ඇත්තේ වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය අත්අඩංගුවට ගැනීමට සතියකට පෙර සිදු වූ යතුරුපැදිය පෙරලීමකින් ඔහුගේ කකුල තුවාල වූ බවත්, දණහිසේ සහ දණහිසට පහළින් සීරීම් තුවාල ඇති වූ බවත් ප්‍රකාශ කළ බවයි. තවද, එකී සටහනෙහිම වින්දිත පාර්ශවයේ අතේ ඇඟිල්ලක් ඉදිමී ඇති බවත්, එය ද අනතුර සිදුවන අවස්ථාවේදී සිදු වූ තුවාලයක් බවට පෙනී යන බවත් සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

එහෙත් වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ එකී ඇඟිල්ලෙහි අස්ථි බිඳීමක් සිදු වී ඇති බවටත්, එම තුවාලය වින්දිත පාර්ශවය විසින් ලබාදී ඇති රෝග ඉතිහාසය තුළ සඳහන් ඔහු හට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට වන ප්‍රකාශය සමඟ සැසඳෙන බවටත්, 2022.10.15 වන දින සිදු වූ රිය අනතුරක් හේතුවෙන් වින්දිත පාර්ශවයේ දකුණු

පාදයෙහි අස්ථි බිඳීමක් සිදු වී ඇති බවටත්, ඒ සම්බන්ධයෙන් සායනික වාර්තාවන් පවතින බවටත් සඳහන් කර තිබෙන බැවින් 1 වන වගඋත්තරකරු වන පො.ප. වල්පොල නම් නිලධාරියා විසින් යොදා ඇති ඉහත කී සටහනෙහි සඳහන් කර ඇති පරිදි වින්දිත පාර්ශවයේ ඇඟිල්ල ඉදිමී හා කැඩී ඇත්තේ ඊට සතියකට පෙර සිදුවූ අනතුරක් හේතුවෙන් බවට වන ප්‍රකාශය පිළිගත නොහැකි වන බව පෙනී යයි.

එසේම, 2022.11.16 වන දින වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය අංක බී 1676/2022 යටතේ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී පොලිස් නිලධාරීන් විසින් තමන්ට පහරදුන් බවට වින්දිත පාර්ශවය විසින් අධිකරණයට දැනුම් දීම හේතුවෙන් මහේස්ත්‍රාත්වරයා විසින් වින්දිත පාර්ශවය එදිනම මාතලේ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත බන්ධනාගාරය මගින් ඉදිරිපත් කළ යුතු බවටත් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු බවටත් නියෝග කර තිබියදී 1 වන වගඋත්තරකරු වන පො.ප. වල්පොල නම් නිලධාරියා විසින් 2022.11.19 වන දින යොදා ඇති ඉහත සඳහන් කරන ලද සටහනෙහි ඇතුළත් තොරතුරු වල නිරවද්‍යභාවය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතුව ඇති බව ද නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති මාතලේ පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතේ සටහන් පරීක්ෂා කර බැලීමේදී 2022.11.15 වන දින පිටුව 223 සහ ඡේදය 233හි පැය 15.15ට උපසේවක පො.සැ. 6593 ලලිත් නම් නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අය ඇතුළු සැකකරුවන් පරීක්ෂා කර බලා භාරගත් බවත්, ඔවුන්ගේ පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොවූ බවත් සඳහන් කර ඇත. එසේහෙයින් 1 වන වගඋත්තරකරු වන පො.ප. වල්පොල නම් නිලධාරියා හට නිරීක්ෂණය වූ ඉහත කී තුවාල උපසේවක පො.සැ. 6593 ලලිත් නම් නිලධාරියා හට නිරීක්ෂණය නොවීම ගැටලු සහගත බව ද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේදී 1 සිට 8 දක්වා වන වගඋත්තරකරුවන් වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී. මහානාම යන අය අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, මාතලේ මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි එම්.ආර්. නිස්රින් විසින් ඉදිරිපත් කර ඇති වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී.මහානාම යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පොලිස් නිලධාරීන් විසින් ඔහු හට සිදු කරන ලද පහරදීම් හේතුවෙන් තුවාල සිදු වී ඇති බව තහවුරු වේ.

වින්දිත පාර්ශවය වන එම්.වී.එම්.ජී. මහානාම යන අය විසින් ඔහු හට පහරදීම් සිදු කරන ලද පොලිස් නිලධාරීන් අතරින් 3 වන වගඋත්තරකරු වන පො.සැ. 21636 ප්‍රියන්ත යන නිලධාරියා පමණක් හඳුනාගෙන ඇත. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ

11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට වන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම 3 වන වගඋත්තරකරු වන පො.සැ. 21636 ප්‍රියන්ත යන නිලධාරියා විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම, පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 20 හි සඳහන් පොලිස් ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු වන නියෝග නිසි පරිදි අනුගමනය කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත් වී ඇති බව ද තහවුරු වේ. ඒ අනුව 1 සිට 9 දක්වා වන වගඋත්තරකරුවන් සියලු දෙනා විසින් 1978 ආණ්ඩුකම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන් විෂයෙහි වෘත්තීමය වගකීමක් පවතින බැවින් 1 සිට 8 දක්වා වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 9 වන වගඋත්තරකරු අධීක්ෂණ වගකීමෙන් බැඳෙන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. 3 වන වගඋත්තරකරු විසින් රුපියල් විසිපන්දහස (රු.25,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. 1 වන වගඋත්තරකරු විසින් රුපියල් හත්දහස් පන්සියය (රු.7,500/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

3. 1 සිට 9 දක්වා වන වගඋත්තරකරුවන් විසින් මෙම සිදුවීමේ දී ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඔවුන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පතිවරයා විසින් පියවර ගත යුතු ය.

2025. 02 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී දෙහිදෙණිය, | නිමල් ජී .පුංචිහේවා, |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික), | කොමසාරිස්, |
| සභාපති, | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | |
| විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය | නිමල් ජී. පුංචිහේවා |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) | ජ්‍යෙෂ්ඨ නීතිඥ |
| සභාපති | කොමසාරිස් |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත් -: 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් වින්දිත පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.